# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1980 අංක 30 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි

---

1980 ඔක්තෝබර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IIවන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 30 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 අගෝස්තු මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 25/80.

**1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1980 අංක 30 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනතේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "අවසාන විය යුතු ය." යන වචන වෙනුවට පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1979 අංක 52 දරන පනතේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම.

"අවසාන විය යුතු ය:

එසේ වුව ද පරිච්ඡින්න කරන ලද ආඥාපනතේ 46 වන වගන්තිය යටතේ පේටන්ට් බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරනු ලැබ, 189 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයාට දෙන ලද අභිමතය ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබ, මේ පනතේ 76 වන වගන්තිය යටතේ පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක, ඒ පේටන්ට් බලපත්‍රය—

(අ) මුල් පේටන්ට් බලපත්‍රය එක්සත් රාජධානියෙහි බලාත්මක ව පවත්නා තාක් කල්; හෝ

(ආ) ඉල්ලීමේ දින සිට අවුරුදු පහළොවක කාලය ඉකුත් වන තෙක්

යන සිද්ධීන් දෙකින් කලින් සිදුවන කවර වූ හෝ සිද්ධිය තෙක් බලාත්මකව පැවතිය යුතු ය:

එසේ ම තවදුරටත් මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද, පරිච්ඡින්න කරන ලද ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ පේටන්ට් බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරනු ලැබ, මේ පනතේ 76 වන වගන්තිය යටතේ පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක, ඒ පේටන්ට් බලපත්‍රය ඉල්ලීමේ දින සිට නොකඩවා අවුරුදු පහළොවක් බලාත්මක විය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 189 වන වගන්තියෙහි (4) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 189 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද රෙජිස්ට්‍රාර්වරයා විසින්, පරිච්ඡින්න කරන ලද ආඥාපනතේ 46 වන වගන්තිය යටතේ වූ ඉල්ලීම් සම්බන්ධයෙන් මේ පනතේ 76 වන වගන්තිය යටතේ සහතිකයක් තම අභිමතය අනුව නිකුත් කරනු ලැබිය හැකි ය.".

2—ඒ 50563—10,050 (80/07)

සංශෝධන අතීතයට බලපෑම.

4. මේ පනතේ ඉහතින් වූ විධිවිධාන මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.